# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,690 - 2011 ජනවාරි මස 21 වැනි සිකුරාදා - 2011.01.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 38 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 40 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 43 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජනවාරි මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජනවාරි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


37- B 080190—3,350 (2011/01)
A1–

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

D/22/NY/465.

2011 අංක 04

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2009 සැප්තැම්බර් මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායේ සිට නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

කපිතාන් (සැ) දොන් අශෝක විජේගුණවර්ධන, යූඑස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0299

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2009ක් වූ අගෝස්තු මස 03 වැනි දින,
කොළඹ දී ය.

01-494

---

D/22/NY/461.

2011 අංක 05

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

නිත්‍ය නාවික බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරුකිරීම

පහත නම සඳහන් නිලධාරියා 2009 අගෝස්තු මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ සිට නිත්‍ය නාවික උප සේවයට මාර කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

කොමාන්ඩර් (සංඥා) රම්පට් දේවගේ ප්‍රසාද් ප්‍රියන්ත රණසිංහ, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0588

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2009ක් වූ අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

01-493

D/22/NY/486.

2011 අංක 06

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැන්වීමක්

**නිලයේ ස්ථිර කිරීම**

2010 ජූලි මස 30 වැනි දින සිට ලුතිතන් - කොමාන්ඩර් වශයෙන්

ලුතිතන් (තාවකාලික ලුතිතන් - කොමාන්ඩර්) තරංග රොෂාන් විදානගමගේ, එන්ආර්එක්ස් 1102, ශ්‍රීලංනාහ

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරියා 2010 ජූලි මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් වෛද්‍යමය හේතූන් මත විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

ලුතිතන් කොමාන්ඩර් තරංග රොෂාන් විදානගමගේ, එන්ආර්එක්ස් 1102, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010ක් වූ අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

01-491

---

D/22/NY/462.

2011 අංක 07

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2009 අගෝස්තු මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්ථිර බලකායේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ල් අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

වෛද්‍ය ලුතිතන් නලින් සංජය ලියනගේ, එන්ආර්එම් 1382, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2009ක් වූ අගෝස්තු මස 03 වැනි දින,
කොළඹ දී ය.

01-489

D/22/NY/463.

2011 අංක 08

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක් සහ නිත්‍ය නාවික උප සේවනයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2009 අගෝස්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගැන්වීම සහ එදින සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිතන් ජයසුන්දර මුදියන්සේලාගේ හේරත් බංඩාර ජයසුන්දර, එන්ආර්එක්ස් 1321, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 03 වැනි දින,
කොළඹ දී ය.

01-488

D/22/NY/464.

2011 අංක 09

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරියා 2009 අගෝස්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් වෛද්‍යමය හේතුන් මත විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිතන් මොහොට්ටි ආරච්චිගේ සංජය අනුරුද්ධ සෝමසිරි, එන්ආර්එක්ස් 1361, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 03 වැනි දින,
කොළඹ දී ය.

01-490

D/22/NY/487.

2011 අංක 10

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරියා 2010 සැප්තැම්බර් මස 02 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාම ගැන්වීම සහ එදින සිට නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිතන් (නැබ) ගම්ලක්ෂගේ චන්දන ප්‍රදීප් කුමාර සෙනෙවිරත්න, එන්ආර්එච් 1469, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

01-487

D/22/NY/491.

2011 අංක 11

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2010 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්ථිර බලකායේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

වැඩ බලන උප ලුතිතන් මැණික්ගේ දිල්නුවන් ක්‍රිෂාන්ත සුහසිංහ, එන්ආර්පී 1356, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 ඔක්තෝබර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

01-492

2011 අංක 12

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද සේවා කාලය දීර්ඝ කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නිලයේ සේවා කාලය 2009 ජනවාරි මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වසරකින් දීර්ඝ කෙරේ.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් සුදම් ප්‍රසාද් කලුආරච්චි (01847) - නි. පො. රා.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ දී ය.

01-485

2011 අංක 13

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද සේවා කාලය දීර්ඝ කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නිලයේ සේවා කාලය 2010 ජනවාරි මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වසරක් සහ මාස හතරකින් දීර්ඝ කෙරේ.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් සුදම් ප්‍රසාද් කලුආරච්චි (01847) -නියමු පොදු රාජකාරි

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2010 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

01-486

---

2011 අංක 14

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද සේවා කාලය දීර්ඝ කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ෆ්ලයිං ඔෆිසර් නිලයේ සේවා කාලය 2010 පෙබරවාරි මස 08 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වසරකින් දීර්ඝ කෙරේ.

ෆ්ලයිං ඔෆිසර් උඩුකලගේ ධම්මික ආරියසේන (02427) - නි. පො. රා.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2010 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.

01-372

---

# රජයේ නිවේදන

**1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම**

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1)26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එන්. ඩබ්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2011 ජනවාරි මස 03 වැනි දින,
අංක 80, සාංචිආරච්චි වත්ත,
අධිකරණ මාවත,
කොළඹ 12.

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියාගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (01)<br>40353 | පයාගලගේ පොන්සි අයිරාංගනී මිය,<br>හෙවත් කොන්සි අයිරාංගනී මිය,<br>අංක 483/4, කජුහේනවත්ත,<br>කඩවත | වීරතුංග ආරච්චිගේ සම්පත් පාලිත ද සේරම් මයා.,<br>අංක 248, කුරුකුලාව,<br>රාගම |
| (02)<br>41087 | චන්ද්‍රසිරි සමන් කරුණානායක මයා.<br>අංක 119, නව කොළඹ පාර,<br>පොල්ගහවෙල | 01. මාවත්තගේ කිරි මැණිකේ හෙවත්<br>කමණි රංගිකා මහවත්තගේ මිය,<br>එඩිසන්ස්, කොළඹ පාර,<br>වඳුරාගල, කුරුණෑගල.<br><br>02. රාගල්කන්ද ආරච්චිල්ලාගේ පේමරත්න මයා,<br>ගම්පති නිවස,<br>රාගල් කන්ද, අලව්ව.<br><br>03. හේනේපොලගේ සුනිල් ආරියදාස මයා,<br>අංක 17/1, අලව්ව පාර,<br>පොල්ගහවෙල |
| (03)<br>41391 | එදිරිසූරිය මොහොට්ටිගේ නිහාල්<br>චන්ද්‍රසිරි ද සේරම් මයා,<br>(ඇටෝර්නි බලකරු)<br>එදිරිසූරිය මොහොට්ටිගේ නදීකා ප්‍රියදර්ශනී<br>ද සේරම් වෙනුවෙන්,<br>අංක 128, බටුවත්ත, රාගම | මැල්ලව තන්ත්‍රිගේ චන්ද්‍රවතී පෙරේරා මිය,<br>අංක 122බී, බටුවත්ත,<br>රාගම |
| (04)<br>41397 | කහඳවල ආරච්චිගේ රාණිමැණිකේ මිය.,<br>බෝහන්දිය,<br>ඉලුක්හේන | සෙනරත් ගුණසේකර විදානරාලලාගේ<br>නිශාන්ත කුමාර මයා,<br>කිරාවැව,<br>ඉලුක්හේන |
| (05)<br>41432 | මඩපාතගේ විජේසේකර මයා,<br>අංක 9, උඩහවලව්ව,<br>මාරපන පාර,<br>රත්නපුර | 01. වක්කුඹුර කන්කානමලාගේ ලලිත්<br>ජයන්ත වක්කුඹුර මයා,<br>අංක 169/1, අංගම්මන පාර,<br>ගනේගොඩ, රත්නපුර<br><br>02. හෙට්ටිආරච්චිලාගේ නිරෝෂන් ලක්මාල්<br>සුමනවීර මයා,<br>අංක 1/40සී, ගොඩගම්පල, පරකඩුව, රත්නපුර |
| (06)<br>41526 | රත්නායක මුදියන්සේලාගේ අනුලාවතී මිය,<br>කොළඹලාමුල්ල,<br>තලවත්තේගෙදර,<br>පොල්ගහවෙල | රත්නායක මුදියන්සේලාගේ මල්කාන්ති රත්නායක මිය,<br>පහළ වලව්ව,<br>කොළඹලාමුල්ල, තලවත්තේ ගෙදර,<br>පොල්ගහවෙල |

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියගේ නම සහ ලිපිනය |
|---|---|---|
| (07) 41565 | හේවාරාල්ලාගේ චමින්ද පුෂ්පකුමාර මයා, එෆ්. 272/3, වැන්දල, රුවන්වැල්ල | රංචාගොඩ ගමගේ ක්ලෙමන්ට් දේශප්‍රිය රංචාගොඩ මයා, අටුළුගම, දෙහිඕවිට |
| (08) 41626 | මීගහමඩිත්තේ ගෙදර ඇන්ටන් ජයරත්න මයා, අංක 308, නවජීවන, මීගහමඩිත්ත, අංකුඹුර | ගල්ලනවත්තේ ගෙදර චන්දන කුමාර වික්‍රමසිංහ මයා, අංක 210, සියඹලාඇල්ල, දෙල්විට |
| (09) 41647 | 01.වරාහේන ලියනගේ අජිත් ධම්මික ලියනගේ මයා, 02. සුනේත්‍රා ඈන් කරුණාරත්න මිය, අංක 70/4, දේවාල පාර, දොලහේන, පිටිපන දකුණ, හෝමාගම | පියසේන කරන්නාගොඩ මයා, අංක 523/60/7, මහින්ද මාවත, පිටිපන උතුර, හෝමාගම |
| (10) 41673 | 01.විතාරමලාගේ ලීලාවතී මිය, 02. සබරගමු ආරච්චිලාගේ චිත්‍රාංගනී අමරසේන මිය, කිරිවත්ත, යටන්වල, රුවන්වැල්ල | මාගලවත්තෙ විදානේලාගේ සිරිමා රංජනී මිය, යටන්වල කඩේ බාරේ, රුවන්වැල්ල |
| (11) 41710 | අනුර මෙන්ඩිස් ගුණසේකර මයා, වෙනුවෙන් චන්ද්‍රා ලෙටීෂියා මෙන්ඩිස් ගුණසේකර මිය, (අධිකරණයෙන් පත්කර ඇති භාරකාරිය) අංක 278, ඉබ්බන්වැව, පුස්සැල්ලාව | රණසිංහ ආරච්චිගේ කුසුමාවතී මිය, අංක 182/1, පුවක්වත්ත පාර, මීගොඩ |
| (12) 41756 | රත්නායක මුදියන්සේලාගේ මල්ලිකා මිය, අංක 39, මැදවත්ත, හංවැල්ල, බදුල්ල | සම්පත් ඉන්දික ජයවර්ධන මයා, මීරහවත්ත, වැලිමඩ |
| (13) 41770 | 01.ජාමුණි රොසලින් නෝනා නොහොත් රුමුදු සිල්වා මිය, අංක 261, කොළබද, ධීරක්කන්ද මාවත, පොහොද්දරමුල්ල, වාද්දුව<br><br>02. ටිකිරියාදුර ලසත් චතුරංග මයා, අංක 261, කොළබද, ධීරක්කන්ද මාවත, පොහොද්දරමුල්ල, වාද්දුව | පට්ටිය පාවුල වඩුගේ දොන් රමණි ශ්‍රියාලතා මිය, අංක 08, සමුද්‍රාසන්න පාර, ගල්කිස්ස |
| (14) 41772 | ගමමැද ලියනගේ පිලමින් පෙරේරා මිය, අංක 367, බෝපිටිය, පමුණුගම | කාරියකරවනගේ සෙබස්ටියන් ඇන්ටනි ප්‍රනාන්දු මයා, අංක 172/බී3, හල්මුල්ල, වැල්ලම්පිටිය |
| (15) 41790 | වීරසිංහ මුදියන්සේලාගේ ගුණවතී මිය, අංක 12, අඩුකුලී නිවාස, දෙල්ගමුව, කුරුවිට | මහදුරගේ පියසේන මයා, අංක 132, හිග්ගස්හේන, කුරුවිට |
| (16) 41800 | කුරුපයියා රෙන්ගනාදන් මයා, මොණරකැලේ වත්ත, සිරිගල පහළ කොටස, සිරිගල, මොණරාගල | දොඩම් පහලගේ නුවන් රසාංජන මයා, මාගන්දන මුල්ල, බෝඅතුපිටිය, මොණරාගල |

### සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වැනි හා 4 වැනි වගන්ති වලින් මා වෙත පැවරුනු බලතල ප්‍රකාර කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් වන මම මේ නිවේදනයෙන්

01. නුගේගොඩ ජනතා පොල, අංක 14 දරන ස්ථානයේ පිහිටි නුගේගොඩ ජනතා පොල එක්සත් වෙළඳ සංගමය නමැති සමිතිය, සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි.

02. සමිති ආඥාපනතේ 5 (4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කිරීමෙන් ඒ ආඥාපනතේ අදාල කිරීම් එකී සමිතියට සීමා කරමි.

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2010ක් වූ දෙසැම්බර් මස 30 වැනි දින,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය,
අංක 73/1, ගාලු පාර,
කොළඹ 03.

01-455

### සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වැනි හා 4 වැනි වගන්තිවලින් මා වෙත පැවරුනු බලතල ප්‍රකාර කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් වන මම මේ නිවේදනයෙන්

01. කොළඹ 15, මට්ටක්කුලිය ක්‍රෝව් අයිලන්ඩ්, සී බ්‍රීස් ගාර්ඩන්, අංක 37 දරන ස්ථානයේ පිහිටි සී බ්‍රීස් ගාර්ඩන් වෙල්ෆෙයා සොසයිටි නමැති සමිතිය, සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි.

02. සමිති ආඥාපනතේ 5 (4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කිරීමෙන් ඒ ආඥාපනතේ අදාල කිරීම් එකී සමිතියට සීමා කරමි.

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2010ක් වූ දෙසැම්බර් මස 30 වැනි දින,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය,
අංක 73/1, ගාලු පාර,
කොළඹ 03.

01-456

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 04/001/02/04203/පීඑම්ජී/002.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.09 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් බී. ආර්. එම්. එස්. රත්නායක විසින් සහතික කරන ලද 2008.09.23 දින හා අංක 320 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, මීරිගම පදිංචි ජයසින් පේඩිගේ සඳුන් සානක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.05.26 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හැට හතර දහස් හයසිය අසූවයි ශත අසූ දෙක (රු. 2,64,680.82)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 320 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය පනස් දෙකයි ශත විසිඅට (152.28) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න).

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 09හි බලයලත් වෙන්දේසිකාර එස්. මනම්පේරි මෙනවියට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ, කොටදෙනියාව උප කාර්යාල සීමාව තුළ හා පිටිගම් කෝරළේ. යටිගහපත්තුවේ, හල්පේ සහ උඩුගහපත්තුවේ ඇලපිලියාව ගම් දෙකට ඇතුලත්ව පිහිටි කටුකුරුදුගස්යාය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වෙලගෙදර විසින් සකසන ලද 1997.07.26 දිනැති හා අංක 3559 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 39 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 18.0ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස හා ඒ මත පිහිටි ගොඩනැගිලි ඇතුලු සියළු දේත් සමග වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී. 297/178 යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද එකී පිඹුරේ වෙන්කර ඇති අඩි 20 පළල පාර පාවිච්චි කිරීමට ඇති අයිතිය ද සමග වේ.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2011 ජනවාරි මස 06 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-454/2

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 01/501/02/00810/ඒ1/286.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.11.25 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. වී. පී. කුරේ විසින් සහතික කරන ලද 2008.04.01 දින හා අංක 1303 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 05, පදිංචි මේරි කැන්ඩිඩා රුද්‍රිගු නොහොත් ප්‍රනාන්දු, වැලරි රුබේරු විවාහයට පෙර පෙරේරා (ජීවිත භුක්තිය හිමිකරු) සහ සුජිත් දිලුක්ෂ ඇන්තනි රුද්‍රිගු යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.11.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එකොලොස් මිලියන නවලක්ෂ හැට හතර දහස් හයසිය අසූ හතයි ශත හතලිහ (රු. 11,964,687.40)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1303 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් අටදහස් එකසිය අනූ හතරයි ශත අනූ නවය (රු. 8,194.99) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න.)

මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, බෙල්මන්ට් වීදිය, දෙවන මහළ, අංක 53හි බලයලත් වෙන්දේසිකාර කේ. පී. එන්. සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, අදිකාරි පත්තුවේ, සියනෑ කෝරළයේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ කනත්ත බ්‍රෝඩ්වේ මාවත වරිපනම් අංක 37හි ඊරියවැටිය පිහිටි දඹුගහහේන (හොලිවුඩ්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. සී. එම්. එස්. විමලරත්න විසින් සකසන ලද 2008.02.08 වැනි දිනැති හා අංක 45/2008 දරන මිනුම් පිඹුරේ කැබලි අංක ඒ ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 22.11ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ඇතුලු සියලු දේත් සමග වේ.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 714/128 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2011 ජනවාරි මස 06 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-454/1

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 266139.
දෙහිගස්පගේ විජිත්.

2010 මැයි මස 26 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. සෙනරත් විසින් 2005 නොවැම්බර් මස 02 වැනි දින සහතික කරන ලද අංක 4424 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දෙහිගස්පගේ විජිත් ණයකරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දාහත් ලක්ෂ තිස්හයදහස් අටසිය විසිහතරයි ශත පනස්පහක් (රු. 17,36,824.55) මුදලක් 2010 මාර්තු මස 30 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දාහත් ලක්ෂ තිස්හයදහස් අටසිය විසිහතරයි ශත පනස්පහක (රු. 17,36,824.55) මුදල අයකර ගැනීම සඳහා 2010 මාර්තු මස 31 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 12,13,328.14ක මුදල මත 22%ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් වියදම් ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇති යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 4424 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ අංක 99හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

අනුග්‍රහලත් මිනින්දෝරු එස්. එල්. ගලප්පත්ති විසින් 1983 ඔක්තෝබර් මස 11 වැනි දින සාදන ලදුව මාතර දිස්ත්‍රික් අධිකරණයේ නඩු අංක P10632හි ගොනුගත වී ඇති අංක 2110 දරන පිඹුරෙහි දැක්වෙන දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, ගඟබොඩ පත්තුව තුළ කිරින්දේ පිහිටි ජුල්ගහවත්ත කියන ඉඩමේ පස්බිම, සහ වගාවන් යන සියල්ල සහ සියළුම ගොඩනැගිලි සහිතව එහි පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කර ලොට් 3 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : ජුල්ගහමඩිත්ත වෙන් කරන (වඩා නිවැරදිව පුවක්ගහමඩිත්ත) ඇල ද, නැගෙනහිරට : වැව වෙන් කරන ඇල සහ පුවක්මඩිත්ත සහ එම ඉඩමේ ලොට් 2 ද, දකුණට : ගම්සභා පාර ද සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 4 සහ 5 ද යන මායිම් තුළ රූඩ් එකක් සහ පර්චස් තුනයි දශම දෙකයි තුනක් (අ. 0, රූ. 1, පර්. 3.23) විශාල ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C506/282 යොමුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවල මිය,
සමාගම් ලේකම්.

01-429

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක :218041.
කිතුන ගමගේ දේශාන් සම්පත් සහ සුජීවා නිල්මිණි ජයසිංහ.

2009 සැප්තැම්බර් මස 16 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී :

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. සී. විජේනාරායන විසින් 2004 නොවැම්බර් මස 29 වැනි දින සහතික කරන ලද අංක 923 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කිතුන ගමගේ දේශාන් සම්පත් සහ සුජීවා නිල්මිණි ජයසිංහ ණයකරුවන් හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන එකක් සහ හාරලක්ෂ පනස් දහස් දෙසිය පනස් හතරයි ශත විසි දෙකක (රු. 14,50,254.22) මුදලක් 2009 ජූනි මස 30 වැනි දි වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන එකක් සහ හාරලක්ෂ පනස් දහස් දෙසිය පනස් හතරයි ශත විසි දෙකක (රු. 14,50,254.22) මුදල අයකර ගැනීම සඳහා 2009 ජූලි මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 13,32,383.11ක නොගෙවූ ඉතිරි ණය මුදල මත 15%ක වැඩිදුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් වියදම් ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇති යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 923 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12, හල්ෆ්ස්ඩොර්ප් වීදියේ අංක 99හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, දකුණු ගඟබඩ පත්තුවේ, ගිමෙල්ලගහ පිහිටි හොරගොඩවත්ත නම් ඉඩමේ භූමිය, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ඒකාබද්ධ කළ ලොට් 04 සහ ලොට් 05 නම් ප්‍රත්‍යාසන්න ඉඩම් වල පිහිටි ලොට් ඒ හි අනු බෙදුමක් වූ ලොට් ඒ2 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේම ලොට් ඒ හි ලොට් ඒ1 සහ එම ඉඩමේම ලොට් 03 ද, නැගෙනහිරට : ගම් වාසීන්ට අයිති ඉඩම ද, දකුණට : එම ඉඩමේම ලොට් බී ද, බස්නාහිරට : එම ඉඩමේම ලොට් 10 (ප්‍රධාන මාර්ගයේ සිට කෙරදෙවලට ඇති පාර) ද, යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් විසි දෙකයි දශම එකයි දෙකක් (අ. 0. රූ. 1, පර්. 22.12) හෝ හෙක්ටයාර් 0.1571ක් විශාල ඉඩම බලයලත් මිනින්දෝරු ටී. ඩී. වික්‍රමනායක විසින් 2003.11.08 වැනි දින සාදන ලද පිඹුරු අංක 347ට අනුව ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H196/210 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

01-431

---

**සෙලාන් බැංකුව පීඑල්සී - බොරැල්ල ශාඛාව**
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0820-624073-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2010.10.29 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. ආර්. අමරසේන විසින් සහතික කරන ලද 2005 ඔක්තෝබර් මස 21 දිනැති අංක 330 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම තලවතුගොඩ පදිංචි බිමල් රෝයි රත්නායක යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහහතරලක්ෂ විසිදහස් අටසිය හතලිස් තුනයි ශත හැත්තෑනවයක (රු. 14,20,843.79) මුදලක්, 2008 අප්‍රේල් මස 24 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 14,20,843.79 මුදලද, 2008 අප්‍රේල් මස 25 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් අට (38%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 330 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (හෝමාගම ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ තලවතුගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. පතිරණ විසින් සාදන ලද 1998 සැප්තැම්බර් මස 09 වැනි දිනැති අංක 1926 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන

කෝන්ගහවත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 4බී ලකුණු කළ (බලයලත් මිනින්දෝරු ඩී. ඒ. රූබසිංහ විසින් සාදන ලද 1968 ඔක්තෝබර් මස 10 වැනි දිනැති අංක 2027 දරන සැලැස්මේ සඳහන් ලොට් 4හි අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 4 ඊ ද, නැගෙනහිරට : ලොට් 4ඒ ද, දකුණට : ලොට් 4ඩී සහ බස්නහිරට : ලොට් 4සී ද යන මායිම් තුළ එකී අංක 1926 දරන සැලැස්ම අනුව පර්චස් දහතුනක් (අ. 0, රූ. 0, පර්. 13) විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් කාණ්ඩය/පත්‍රිරුව පී 1603/64 සහ 63 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 2027 දරන සැලැස්මේ සඳහන් ලොට් 9 තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග ය.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

01-448

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.09.23 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් ඩී. බී. වෙලගෙදර විසින් සහතික කරන ලද 2007.09.14 දිනැති අංක 19938 දරන උකස් බැඳුම්කරය මත මුල් මුදල හා 2010.03.25 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් විසිලක්ෂ දහතුන් දහස් තිස්පහයි ශත අටක (රු. 20,13,035.08) මුදලක් සමග රුපියල් දහඅටලක්ෂ හැත්තෑපන් දහස් හයසිය දහඅටයි ශත හතලිස් පහක (රු. 18,75,618.45) මුදලක් මත වසරකට සියයට 18% බැගින් පොළියක් ද, 2010.03.26 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ගල්තුඩේ, හිරාන, සමගි මාවත, අංක 242හි පදිංචි ලද්දුසිංහ බදු නිශාන්ති දිලූකා ජයසූරිය මහත්මිය සහ හේවාවසම් සරුක්කාලිගේ ජිනේෂ් ප්‍රදීප් ප්‍රනාන්දු යන අයගෙන් එක්ව සහ වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. එකී උකස් බැඳුම්කරය මත අයවිය යුතු ඉහත 1හි සඳහන් මුදල සමග විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට හලාවත, රදගුරු මාවත, අංක 4Dහි පදිංචි වෙන්දේසිකාර ඩී. එල්. ජේ. නිශ්ශංක මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිලිල්ලි හත්පත්තුවේ, තිරගන්දහය කෝරළේ, තල්කොටේ සහ නයිලිය, විල්බාව, බෝයගනේ, අකරගනේ ග්‍රාමයන්හි පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ලද 2004.02.11 දිනැති අංක 4/443 දරන පිඹුරේ රෙග්ලන් එස්ටේට් හි ලොට් 1C ලෙස සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : එකී පිඹුරෙහි ලොට් 1A සහ 1B සහ පාර ද, නැගෙනහිරට : පාර එම මිනින්දෝරු විසින්ම සාදන ලද ලොට් 7 දරන පිඹුරේ අංක 7 ද, දකුණට : එකී ඉඩමේ ඉතිරි කොටස ද, බස්නාහිරට : අංක 3/395 දරන පිඹුරේ ලොට් අංක 2 ද මායිම්ව රූඩ් එකයි පර්චස් අටක (අ. 0, රූ. 1, පර්. 8) බිම් ප්‍රමාණයකින් යුක්ත එහි ඇති සියලු දේ ද අයිතිවන අතර බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ලද අංක 8 දරන පිඹුරෙහි ලොට් 7 (එහෙත් වඩා නිවැරදිව පිඹුරු අංක 7 හි ලොට් 8) ලෙස නිරූපිත පාර භාවිතා කිරීමේ අයිතිය ද ඇත.

එකී අකරගනේ, බෝයගනේ, විල්බාව, තල්කොටේ සහ නයිලිය ග්‍රාමයන්හි පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ලද 2003.01.14 වැනි දිනැති අංක 3/395 දරන පිඹුරෙහි රෙග්ලන් එස්ටේට් හි ලොට් අංක 1 ලෙස නිරූපනය කර ඇති ඉඩමෙහි බෙදූ පංගුවක් හෙවත් කොටසක් වන එකී බිම් කැබැල්ල උතුරට : කොළඹ පාරේ සිට බෝගමුව දක්වා ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : පිඹුරු අංක 7හි ලොට් 8 හා 7 ද, දකුණට : එකී ඉඩමෙහි ඉතිරි කොටස ද, බස්නාහිරට : පිඹුරු අංක 3/395 හි ලොට් අංක 2 ද මායිම්ව රූඩ් දෙකක (අ. 0, රූ. 2, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1503/61 වන පත්‍රිරුවෙහි ලියාපදිංචි කර ඇත.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, තිරගන්දහයේ කෝරළේ, අකරගනේ, බෝයගනේ, විල්බාව, තල්කොටේ සහ නයිලිය ග්‍රාමයන්හි පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ලද 2003.08.14 දිනැති අංක 03/502/A දරන පිඹුරෙහි රෙග්ලන් එස්ටේට් හි ලොට් අංක 3 ලෙස නිරූපිත සීමා නිර්ණය කරන ලද බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : එකී පිඹුරෙහි ලොට් 2 සහ 4 ද, සහ පිඹුරු අංක 03/502හි ලොට් 2 ද, නැගෙනහිරට : පිඹුරු අංක 04/443හි ලොට් 1C සහ 1993.05.10 දිනැති අංක 7 දරන පිඹුරෙහි ලොට් 2 ද, දකුණට : අංක 3/502 දරන පිඹුරෙහි ලොට් අංක 4 ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1963.10.04 දිනැති අංක 855 දරන පිඹුරෙහි ලොට් අංක 57 සහ 65 දක්වා ද, මායිම්ව අක්කර එකයි පර්චස් විසිඅටයි දශම තුනක (අ. 1, රූ. 0, පර්. 28.3) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියළු දේ ද වේ. එකී අකරගනේ, බෝයගනේ, විල්බාව, තල්කොටේ සහ නයිලිය ග්‍රාමයන්හි පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ලද 2003.06.16 දිනැති අංක 3/502 දරන පිඹුරෙහි රෙග්ලාන් එස්ටේට් හි ලොට් අංක 3 වශයෙන් නිරූපිත ඉඩමෙහි බෙදූ පංගුවක් වන එකී ඉඩම් කැබැල්ල උතුරට : ගම්සභා පාර ද, නැගෙනහිරට : ලොට් අංක 5 ද, දකුණට : දඹකන්දවත්ත ද, බස්නාහිරට : දඹකන්දවත්ත සහ රෙග්ලාන් එස්ටේට් හි පංගුවක් ද, මායිම්ව අක්කර දාහතරයි රූඩ් තුනයි පර්චස් හයක (අ. 14, රූ. 3, පර්. 6) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, එහි ඇති සියළු දේ ද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1033/269 වැනි පත්‍රිරුවෙහි ලියාපදිංචි කර ඇත.

2. එකී අකරගනේ, බෝයගනේ, විල්බාව, තල්කොටේ සහ නයිලිය ග්‍රාමයන්හි පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ලද 2003.08.14 දිනැති අංක 03/502/A දරන පිඹුරෙහි නිරූපිත රෙග්ලන් එස්ටේට් හි ලොට් අංක 4හි සීමා නිරණය කොට නිරූපණය කරන ලද බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : කොළඹ පාරේ සිට බෝගමුව දක්වා වූ ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : පිඹුරු අංක 03/502Aහි ලොට් 2 ද, දකුණට : පිඹුරු අංක 03/502/A ලොට් 3 ද, බස්නාහිරට : ලොට් අංක 2 හා 1 ද, මායිම්ව පර්චස් හතයි දශම හතක (අ. 0, රූ. 0, පර්. 7.7.) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ ද වේ. එකී ආකාරයට පිහිටි බලයලත් මිනින්දෝරු සී. එස්. පෙරේරා විසින් සාදන

ලද 1974.11.20 දිනැති අංක 529 දරන පිඹුරෙහි රෙග්ලාන් එස්ටේට් හි ලොට් 4 ලෙස නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ලෙන් බෙදූ පංගුවක් වන එකී ඉඩම් කැබැල්ල උතුරට : ගම්සභා පාර ද, නැගෙනහිරට : ලොට් අංක 5 ද, දකුණට : දඹකන්ද එස්ටේට් ද, බස්නාහිරට : දඹකන්ද එස්ටේට් සහ රෙග්ලන් එස්ටේට් හි කොටසක් ද මායිම්ව අක්කර දාහතරයි රූඩ් තුනයි පර්චස් හයක (අ. 14, රූ. 3, පර්. 6) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියළු දේ ද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1033/269 දරන පත්‍රිරුවෙහි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. එම්. ගුණවර්ධන මහතා,
කළමනාකරු.

ලංකා බැංකුව,
2 වැනි නගර ශාඛාව,
කුරුණෑගල.

01-477

---

## ලංකා බැංකුව - හැටන් ශාඛාව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.08.19 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. වී. අන්දරවැව මිය විසින් සහතික කරන ලද 2008.03.07 දිනැති අංක 802 දරන උකස් බැඳුම්කරය මත මුල් මුදල හා 2010.06.21 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් පනස් ලක්ෂ විසිඅට දහස් දෙසිය දොළහයි ශත අනූතුනක (රු. 50,28,212.93) මුදලක් සමග රුපියල් හතලිස් ලක්ෂ විසි තුන්දහස් අටයි ශත තිස් පහක (රු. 40,23,008.35) මුදලක් මත 2010.06.22 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට දහහතරක (14%) වාර්ෂික පොළියක් ද, හැටන්, සයිඩ් වීදියේ, අංක 94ඒ දරන ස්ථානයේ පදිංචි කුතන් කුලේන්ද්‍රන් මයා හා කුතන් චේට්ටි සුරේශ් මයා යන අයවළුන්ගෙන් ලංකා බැංකුවට එක්ව සහ වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

ඉහත කී 2008.03.07 දිනැති අංක 802 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් පනස්ලක්ෂ විසි අටදහස් දෙසිය දොළහයි ශත අනූ තුනක (රු. 50,28,212.93) මුදල සමග 2010.06.22 වැනි දින සිට විකිණීම කරන දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දැනට නුවරඑළිය දිස්ත්‍රික්කයේ, උඩබුලත්ගම කොට්ඨාසයේ, අඹගමුව කෝරළයේ හැටන්-දික්ඔය නගර සභා සීමාව තුළ හැටන් හි පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන මයා විසින් සාදන ලද 1988 අප්‍රේල් 27 වැනි දිනැති අංක 3783 දරන පිඹුරේ කැබලි 4ඒ යනුවෙන් පෙන්නුම් කර ඇති "හැටන් වත්තේ කොටසක් " යයි හඳුන්වනු ලබන ඉහත කී අංක 3783 දරන පිඹුර අනුව, එකී කැබලි 4ඒ යනුවෙන් පෙන්නුම් කර ඇති ඉඩම තුළ පිහිටා ඇති වරිපනම් අංක 92 දරන ගොඩනැගිල්ල සමග උතුරට : ඊ. එස්. ඒ. ගුණවර්ධනගේ දේපළ ද, නැගෙනහිරට : ඊ. එස්. ඒ. ගුණවර්ධනගේ දේපළ හා හැටන් ටවුන් ට්‍රස්ට් දේපළ ද, දකුණට : හැටන් ටවුන් ට්‍රස්ට් දේපළ හා එකී අංක 3783 දරන පිඹුරේ කැබලි 4බී ද, බස්නාහිරට : අංක 4බී දරන කැබැල්ල හා අළුත් පාර ද මායිම් වූ පර්චස් තුනයි දශම හයයි පහක (අ. 0, රූ. 0, පර්. 3.65) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල වේ. මෙය ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩ අංක බී 75/66හි ලියාපදිංචි කරන ලදී.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. බී. වික්‍රමසිංහ මහතා,
කළමනාකරු.

ලංකා බැංකුව,
හැටන් ශාඛාව.

01-478

---

පීවී 67805.

## 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වගන්තිය යටතේ "සුරසළු ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2009.05.14 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "සුරසළු ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "සුරසළු ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 දෙසැම්බර් මස 14 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01-328

පීවී 60872.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "රේන්බෝ ඇග්රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.08.02 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "රේන්බෝ ඇග්රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "රේන්බෝ ඇග්රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 දෙසැම්බර් මස 14 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01-330

පීවී 70120.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "බින්ඩි ඇන්ඩ් කෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2009.11.24 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "බින්ඩි ඇන්ඩ් කෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "බින්ඩි ඇන්ඩ් කෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01-331

---

පීවී 70484.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "අයිලන්ඩ් එයාර් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2009.12.24 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "අයිලන්ඩ් එයාර් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "අයිලන්ඩ් එයාර් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 දෙසැම්බර් මස 14 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01-329

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.